**ශීර්ෂය 292 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 292 - සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 19 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,127.52 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 997.22 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 130.30 ක් හෙවත් සියයට 11.55 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 512.77 | 501.69 | 11.08 | 2.16 |
| මූලධන | 614.75 | 495.53 | 119.22 | 19.39 |
| **එකතුව** | **1,127.52** | **997.22** | **130.30** | **11.55** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 29.46 | 23.82 | 18.46 | 23.32 | 110.00 | 73.60 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0096/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 7.65 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 20.30 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0110/000 | 0.37 |
| 6000/0000/00/0013/0106/000 | 4.28 |
| 6000/0000/00/0002/0153/000 | 1.08 |
| 6000/0000/00/0015/0147/000 | 0.46 |
| 6000/0000/00/0016/0098/000 | 14.11 |
| **එකතුව** | **20.30** |

## 2.5 විගණන නිරීක්ෂණය

---------------------

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-----------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i.) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii.) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (iii.) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (iv.) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (v.) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| (vi.) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (vii.) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වු ලේඛනය | මුදල් රෙගුලාසි 451 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (viii.) | පුද්ගල පඩිනඩි ලේඛනය | මුදල් රෙගුලාසි 453 | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.319,130 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අය නොවී වසර 02 ක සිට වසර 18 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) ඉහත 3.2 (අ) ඡේදයේ දැක්වෙන ණය ශේෂය තුළ 1997 වර්ෂයේ සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.23,265 ක් සහ 2003 වර්ෂයේදී මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.62,668 ක ණය ශේෂ ද ඇතුළත්වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, 2015 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2016 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| (i) ගොඩනැගිලි | 03 | වර්ෂ 03 ක සිට වර්ෂ 15 ක් දක්වා |
| (ii) මෝටර් වාහන | 13 | වර්ෂ 01 ක සිට වර්ෂ 11 ක් දක්වා |

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ලක් අවිධිමත් ලෙස වර්ෂ 15 කට අධික කාලයක් මුළුල්ලේ බාහිර පාර්ශවයක් වෙත මුදාහැර තිබුණි.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-------------------------------------------------------------

වෙනත් ආයතන සතුව තිබුණු ඉඩම් ඒකක 17 ක් විධිමත්ව පවරා නොගෙන දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක කාල පරාසයක් තුළ භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**3.5 අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය අනුව වැටුපෙන් අයකළ යුතු ප්‍රතිශතයන්ට වඩා අඩු ප්‍රතිශත පදනම් කරගෙන රජයේ නිවාස සඳහා කුලී අයකිරීම නිසා, 2012 ජනවාරි මාසයේ සිට 2016 ජූලි මාසය දක්වා කාල පරාසය තුළදී නිලධාරීන්/සේවකයන් 04 ගෙන් රු.176,005 ක නිවාස කුලී අඩුවෙන් අයකර තිබුණි.

**3.6 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

**ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-------------------------------------------------

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් දේශීය කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණ ඇතිව "වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් 2008-2015 කාලය තුළ ක්‍රියාත්මක කර තිබුණි. මෙම ව්‍යාපෘතියට එම කාලය සඳහා දේශීය අරමුදල්වලින් රු.512,466,200 ක මූල්‍ය ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.282,701,755 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.229,764,445 ක් හෙවත් සියයට 44.83 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ කිරි දෙනුන් 125,000 ක් ජාතික කිරි නිෂ්පාදන ක්‍රියාවලියට එක් කිරීමට ඉලක්ක කර තිබුණද, 2015 වර්ෂය අවසානයට එක්කර තිබුණු දෙනුන් සංඛ්‍යාව 54,816 ක් විය. එමෙන්ම ව්‍යාපෘතිය මඟින් ජාතික කිරි නිෂ්පාදනයට එක් කිරීමට ඉලක්කගත කිරි ප්‍රමාණය ලීටර් දශ ලක්ෂ 225 ක් වුවද, කිරි ලීටර් දශ ලක්ෂ 130.37 ක් පමණක් එක් කිරීමට හැකිවී තිබුණි. මේ අනුව අදාල ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.7 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය, ගැටඹේ, පශු සම්පත් දැනුම කේන්ද්‍රය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ කොටසක් 2004 ජූනි 01 දින සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා කුලී අයකිරීමකින් තොරව ලබාදී තිබුණි. ඉන් අනතුරුව 2006 දෙසැම්බර් 05 දින සිට ගිවිසුමකින් තොරව මාසිකව රු.6,000 ක

තක්සේරු කුලියක් ගෙවීමට නියම කර තිබුණි. එහෙත් 2006 දෙසැම්බර් මාසයේ සිට 2011 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළ රු.366,000 ක කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2015 දෙසැම්බර් මාසයේ සිට 2016 ජූනි මාසය දක්වා මාස 06 ක කාලය සඳහාද කිසිදු මුදලක් අයකර නොතිබුණි. මාසිකව රු.6,000 ක් බැගින් වූ කුලිය, මධ්‍යම පළාත් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 මැයි 17 දින සිට රු.12,000 ක් ලෙස තක්සේරු කර තිබුණද එම තක්සේරුව අනුව කුලී අයකර නොතිබුණි. එහෙත් 2012 ජූනි මාසයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා මාස 42 ක් සඳහා රු.6,000 බැගින් කුලී ගෙවා තිබූ බැවින් රු.252,000 ක හිඟ කුලියක් සහ 2015 දෙසැම්බර් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා මාස 06 ක් සඳහා මසකට රු.12,000 බැගින් රු.72,000 ක් ලෙසට රු.324,000 ක කුලියක් අයවිය යුතුව පැවතුණි. මේ අනුව 2006 දෙසැම්බර් මාසයේ සිට 2016 මැයි මාසය දක්වා කාලයට අදාළව රු.690,000ක හිඟ ගෙවල් කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ජල පාරිභෝගික අංක 6939/2 ට අදාළව මහනුවර මහ නගර සභාවේ ජල කර්මාන්ත අංශයෙන් මාසිකව ඉදිරිපත් කරනු ලබන බිල්පතෙහි ඒ ඒ මාසයේ අවසානයට ගෙවිය යුතු මුදල නියමිත දිනට නොගෙවීමේ හේතුවෙන් 2008 ජූනි 12 දින සිට 2011 දෙසැම්බර් 11 දින දක්වා අධි ගාස්තු ලෙස රු.178,920 ක් මහනුවර මහානගර සභාවට ගෙවා තිබුණි. ඉන් පසුව ජල පාරිභෝගික අංක 6939/2 ට හා 3990 ට අදාළව 2012 ජනවාරි මාසයේ සිට 2015 අගෝස්තු මාසය දක්වාද, අංක 553 ට අදාළව 2013 ජනවාරි මාසයේ සිට 2015 අගෝස්තු මාසය දක්වා ද නියමිත දිනට ජල බිල්පත් නොගෙවීමේ හේතුවෙන් එකී කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.125,646 ක අධි ගාස්තුවක් සමාලෝචිත වර්ෂයේදී මහනුවර මහානගර සභාවට ගෙවා තිබුණි. මේ අනුව ජල බිල්පත් වෙනුවෙන් මහනුවර මහා නගර සභාවට ගෙවා තිබුණු රු.304,566 ක අධිගාස්තු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාළ කටයුතු කර නොතිබුණි.

## 3.8 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 170 | 138 | 32 |
| (ii) | තෘතියික මට්ටම | 21 | 20 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 338 | 258 | 80 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 396 | 310 | 86 |
| | **එකතුව** | **925** | **726** | **199** |